# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 243/20 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

### මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

ජනාධිපති කාර්යාලය,
කොළඹ,
1976 දෙසැම්බර් මස 17 වන දින.

නියෝග

1. මෙම නියෝග හදිසි අවස්ථා (පොල් නිෂ්පාදන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකාවෙන් කොප්පරා හෝ පොල් තෙල් අපනයනය කිරීමට අවසර දෙමින් තමා වෙත නිකුත් කරන ලද අපනයන බලපත්‍රයක් තිබුණ ද, මෙම නියෝග බල පවත්නා කාලය තුළදී කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් කොප්පරා හෝ පොල් තෙල් අපනයනය නො කළ යුතුය :

එසේ වුවද, පෙරාතුව සඳහන් විධිවිධාන—

(අ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් අලෙවි මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ වලංගු අපනයන බලපත්‍ර එකක් හෝ වැඩි සංඛ්‍යාවක් මත මෙට්‍රික් ටොන් 1,50,000කට වැඩි නොවන පොල් තෙල් මුළු ප්‍රමාණයක්, 1973 දෙසැම්බර් 1 වනදා හෝ ඊට පසුව ආරම්භ වන අපනයනය කිරීම සම්බන්ධයෙන් ; සහ

(ආ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් අලෙවි මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ වලංගු අපනයන බලපත්‍ර එකක් හෝ වැඩි සංඛ්‍යාවක් මත නොම්මර 1 වර්ගයේ වතු කොප්පරා මෙට්‍රික් ටොන් 3,048කට වැඩි නොවන මුළු ප්‍රමාණයක්, 1974 ජූලි මස 10 වනදා හෝ ඊට පසුව ආරම්භ වන අපනයනය කිරීම සම්බන්ධයෙන්

අදාළ නොවන්නේ ය.

3. පොල් තෙල් මෝල්කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යන්නා වූ ද 1972 මැයි මස 5 වැනි දින අංක 15,009/1 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1972 අංක 1 දරන පොල් සංවර්ධන නියෝගවල 2 වන නියෝගය යටතේ පොල් තෙල් මෝල්කරුවකු වශයෙන් ලියාපදිංචි විය යුතු යයි නියම කරනු ලැබ ඇත්තා වූ ද සෑම තැනැත්තකු ම විසින් නිෂ්පාදනය කරන ලද හෝ තම සන්තකයෙහි ඇත්තා වූ හෝ මුළු පොල් තෙල් ප්‍රමාණය, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් අලෙවි මණ්ඩලයට හෝ ඒ පොල් තෙල් භාර ගැනීමට එකී පොල් අලෙවි මණ්ඩලය විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට භාර දෙන ලෙස ඒ සෑම තැනැත්තකුටම මෙයින් නියම කරනු ලැබේ. පොල් අලෙවි මණ්ඩලයට හෝ එම මණ්ඩලයේ නියමය පිට හෝ භාර දෙන ලද පොල් තෙල් සඳහා ගෙවනු ලබන මිල පොල් අලෙවි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි වන්නේ ය.